ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව

රත්නපුර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 13 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය.

------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

සමාලෝචිත වර්ෂය තුල අපහරණය කරන ලද ඩබල් කැබ් රථයේ පිරිවැය වූ රු. 1,250,000 ක් වත්කම් ගිණුම බැර කරනු වෙනුවට එහි විකුණුම් වටිනාකම වූ රු. 1,230,000 ක් බැර කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල මෝටර් රථ හා කරත්ත වටිනාකම රු. 20,000 ක් වැඩියෙන් පෙන්නුම් කෙරින.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

----------------------------

(අ) ගිණුම් විෂයයන් 09 කට අදාලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ සහ උපයෝගී ලේඛණ අනුව ශේෂයන්ගේ වෙනස රු. 552,889 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට මූල්‍ය ප්‍රකාශන වල සේවක ඇප ආයෝජන රු. 341,142 ක් වූ අතර, සේවක ඇප තැන්පත් ශේෂය රු. 447,119 ක් වූයෙන් ශේෂ අතර රු. 105,977 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-----------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම්. |
|---|---|---|
| | ----------------------------------------- | ------------------- |
| | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | --------------------------------------- | |
| (I) | මුදල් රෙගුලාසි අංක 371(2) | 1986 වර්ෂයේ ලබා දී තිබූ රු. 1,984,402 ක අත්තිකාරම් මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නැවත පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (II) | මුදල් රෙගුලාසි අංක 571 | 2011 වර්ෂයේ සිට පැවතෙන රු. 5,465,459 ක තැන්පතු ශේෂයක් තැන්පතු ලෙසට දිගටම රඳවාගෙන තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 10,742,736 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 10,875,311 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 455 | 455 | 2,739 |
| බදු කුලී | 6,216 | 7,282 | 275 |
| බලපත්‍ර ගාස්තු | 911 | 546 | - |
| වෙනත් ආදායම් | 3,702 | 4,302 | 4,600 |

2.2.2. ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම් හා රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් බදු, වරෙන්තු ගාස්තු, වෙනත් ආදායම් හා වෙනත් ආධාර වල ඇස්තමේන්තුගත ආදායමට වඩා රැස්කල අදායමෙහි පිළිවෙලින් සියයට 27, සියයට 39, සියයට 92 හා සියයට 60 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

2.2.3 ප්‍රචාරන දැන්වීම් පුවරු ගාස්තු

සභාව විසින් 1999 ඔක්තෝබර් 08 දින පිළිගෙන ඇති පළාත් පාලන ආයතන වල සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වන වගන්තිය ප්‍රකාරව හා 2014 සැප්තැම්බර් 26 දිනැති මහ සභා තීරණ අංක 05(15)IV යටතේ සභා බල ප්‍රදේශය තුල දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් අයකල යුතු ගාස්තු අනුව 2014 වර්ෂය තුල දැන්වීම් පුවරු 12 ක් වෙනුවෙන් ගාස්තු අය කර ගෙන තිබුණි. ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් පුවරු සම්බන්ධයෙන් වර්ග ප්‍රමාණය, පිහිටි ස්ථානය වැනි තොරතුරු අඩංගු සවිස්තරාත්මක ලේඛණයක්ද සභාව සතුව නොතිබුණි. සභා බල ප්‍රදේශය තුල පිහිටා ඇති ව්‍යාපාරික ස්ථාන වල ඇති අවසරලත් දැන්වීම් පුවරු වලට අමතරව විවිධ ප්‍රචාරක පුවරු වලින් ගාස්තු අයකර ගැනීමේ වැඩපිළිවෙලක් සභාව සතුව නොතිබුණි.

2.2.4 ජල ගාස්තු

------------

සභාව මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජල ව්‍යාපෘති 02 ක් සම්බන්ධයෙන් ජල පාරිභෝගිකයින් 423 කට අදාලව වර්ෂ ගණනාවක සිට හිඟව පවතින ජල ගාස්තු රු. 1,742,254 ක මුදලක් 2014 දෙසැම්බර් 31 දින වනවිට අයවීමට තිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 ඔක්තෝබර් මස සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණය මඟින් ලැබිය යුතු දඩ මුදල් වලට අදාල උප ලේඛණ ගෙන්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2014 අප්‍රේල් මස සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සභාව වෙත ලැබිය යුතු මුද්දර ගාස්තු ප්‍රමාණයට අදාල උප ලේඛණ ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.6 දුරකථන කුළුණු ගාස්තු

-----------------------------

ශ්‍රී ලංකා ජනරජයේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන ගැසට් නිවේදනය අනුව දුරකථන හා විදුලි සංදේශ කුළුණු ඉදිකිරීම සම්බන්ධයෙන් අයකල යුතු සම්මත ගාස්තු දක්වා තිබුණ ද සභා බල ප්‍රදේශය තුල ස්ථාපිත දුරකථන හා සන්නිවේදන කුළුණු සඳහා අනුමැතිය ලබා දීමේදී විධිමත් ක්‍රමවේදයක් අනුව ගාස්තු අයකිරීමක් සිදුකර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

මෝටර් ග්‍රේඩරය, ලෙලෙන යන්ත්‍රය හා ටිපර් රථය යන වාහන/යන්ත්‍ර සත්‍ය වශයෙන් වැඩ කල පැය ගණන නිශ්චය කර ගැනීම උදෙසා ස්ථාපිත වැඩපිළිවෙලක් නොතිබුණි. මෙම වාහන/යන්ත්‍ර බැහැරට ගෙන යාමේදී හුදෙක් වාචික අවසරය මත පමණක් අවසර දීම සිදු කර තිබු අතර විධිමත් අවසර ලබා දීමක් සිදුවන බවට සාක්ෂි ඉදිරිපත් නොවුණි. ඒ අනුව මෙම වාහන/යන්ත්‍ර වැඩ කල

සත්‍ය පැය ගණන තහවුරු කර ගැනීමටත් ලැබිය යුතු සත්‍ය ආදායම සභාව වෙත ලබාගෙන තිබේද යන්න තහවුරු කරගැනීමට සභාවට හැකියාවක් නොමැති බව අනාවරණය විය.

3.2 වාහන පාලනය

---------------------

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ එක් එක් වාහන සම්බන්ධයෙන් වගකීම ඉන්වෙන්ට්‍රිය සමඟ ලිඛිතව රියදුරුට පවරා නොතිබීම.

(ආ) සභාවේ වාහන සඳහා ඉන්ධන සැපයීමේදී සපයන ලද ඉන්ධන ප්‍රමාණයන් දෛනික ධාවන සටහන් වලට ඇතුලත් කල බවට සටහනක් ඉන්ධන බිල්පතේ සටහන් කර නොතිබීම.

(ඇ) වාහන මිලදී ගත් අවස්ථාවේදී හෝ පසු අවස්ථා වලදී සවි කරනු ලැබූ උපාංග හා උපකරණ සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක විස්තර අඩංගු ඉන්වෙන්ට්‍රි නඩත්තු නොකිරීම.

(ඈ) සභාව වෙත 2014 වර්ෂයේදී ලැබී ඇති ටිපර් රථය 2015 මාර්තු 30 දින වනවිටත් ලියාපදිංචි කර නොතිබීම හා සභාවේ අවශ්‍යතාවයන්ට නොගැලපීම හා රියදුරන් නොමැති බැවින් ප්‍රයෝජනවත් කාර්යයකට යොදවාගෙන නොතිබීම.

3.3 අධිකාර බලය නොළත් ගනුදෙනු

---------------------------------------

2014 නොවැම්බර් 17 දිනැති සභා තීරණ අංක 29 හා 2014 සැප්තැම්බර් 26 දිනැති සභා තීරණ අංක 14 මගින් හිඟහිටි වරිපනම් බදු රු. 78,332 ක් සමුච්චිත අරමුදලට කපාහැර තිබුණි. රු. පනහක් ඉක්මවන මුදලක් අත්හැර දැමීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව අදාල සභා සම්මතය අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සරප්ගේ ලැබීම් පිළිබඳ දෛනික සටහන් පොත දෛනික ගණුදෙනු ලේඛණ සමඟ පරීක්ෂා කිරීම පිළිබඳ වගකීම ප්‍රධාන කළමනාකරණ සහකාර නිළධාරිනිය වෙත පවරා තිබුණද, එකී කාර්යය විධිමත් පරිදි සිදු නොවන බව අනාවරණය විය. දැඩි සැලකිල්ලෙන් හා අවධානයෙන්ද නිරන්තර පසුවිපරම් සහගතවද සිදුවිය යුතු සරප් රාජකාරී සම්බන්ධයෙන් පවතින මෙම අවිධිමත් තත්ත්වය පිළිබඳව පසුගිය වර්ෂයේ විගණන වාර්තාව මඟින් පෙන්වා දී තිබුණද, එය නිවැරදි නොකිරීමේ තත්ත්වය තුල මෙම රාජකාරී වලට අදාලව වැරදි හා වංචා සිදු වීමට ඇති අවදානම විගණනයට කිසිසේත්ම බැහැර කල නොහැක.

(ආ) සභාවේ සේවයේ නියුතුව සිටි නිලධාරීන් 12 දෙනෙක් වෙතින් අයවීමට තිබූ රු. 64,173 ක හිඟ ණය ශේෂයක් නැවත අයකර ගැනීමට නොහැකිව තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල රු. 679,400 ක් වටිනාකමැති වීථි පහන් හා උපකරණ සභාපතිවරයාගේ ඉල්ලීම හා සභා අනුමැතියෙන් මිලදී ගැනීම සිදු කලද, එකී අවශ්‍යතාවය පිළිබඳව තාක්ෂණික නිළධාරීගේ පූර්ව නිර්දේශයක්, වීථි පහන් සවිකිරීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලය සමඟ ඇතිකරගත් එකඟතාවයන්ද විගණනයට ඉදිරිපත් නොවුණි. තවද, වීථි පහන් ලේඛණයක් නඩත්තු කර නොමැති අතර, වීථි පහන් නඩත්තුව සම්බන්ධයෙන් ඍජු අධීක්ෂණයක් සිදුකර නොතිබුණි.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) <u>බෝගහ අතුර මාර්ගය කොන්ක්‍රීට් කිරීම.</u>

- සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කල මෙම කර්මාන්තය වෙනුවෙන් අනුමත කරන ලද රු 1,423,000 ක ඇස්තමේන්තුවක් මත පදනම්ව මාස 03 ක කාල සීමාවක් තුල ඉටු කිරීම සඳහා කරදකැටිය ගොවි සංවිධානය සමඟ රු. 1,401,973 ක වටිනාකමින් යුත් ගිවිසුමකට 2014 ඔක්තෝබර් 02 දින එළඹ තිබුණි.

- ඇස්තමේන්තුවේ වැඩ විෂයය අංක 02 ට අනුව 1:2:4 කොන්ක්‍රීට් මිශ්‍රණය මීටර් කියුබ් 85.73 ක් යෙදීම වෙනුවෙන් රු. 1,232,857 ක් තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා ගැනීමකින් තොරව ගෙවීම් කර තිබුණි. විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2015 අප්‍රේල් මස මාර්ගය භෞතිකව ස්ථාන 02 ක කැණීම් කිරීමේදී යොදා ඇති කොන්ක්‍රීට් මිශ්‍රණය ඉතා පහසුවෙන් ලිහීයන බව නිරීක්ෂණය විය. ඒ අනුව මෙම වැඩ විෂයය වෙනුවෙන් ගෙවීම් කල රු. 1,232,857 ක මුදල ප්‍රමිතියෙන් තොරව ඉටුකල වැඩ විෂයයක් වෙනුවෙන් සිදුකල ගෙවීමක් බවට නිරීක්ෂණය කරනු ලැබේ.

(ආ) <u>එරඩුමණ්ඩිහේන බෝක්කුව ඉදිකිරීම</u>.

- සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කල මෙම කර්මාන්තය වෙනුවෙන් අනුමත කරන ලද රු. 995,459 ක ඇස්තමේන්තුව මත පදනම්ව මාස 03 ක කාල සීමාවක් තුල ඉටු කිරීම සඳහා කරදකැටිය ගොවි සංවිධානය සමඟ රු. 980,747 ක වටිනාකමින් යුත් ගිවිසුමකට 2014 සැප්තැම්බර් 11 දින එළඹ තිබුණි. මෙම බෝක්කුවේ දෙපස යොදන ලද පාදම හා ගල් බැම්ම නිසි ප්‍රමිතියට අනුව ඉදි නොකිරීම නිසා ඉදිකර මාස 1 ½ කට පමණ පසුව ඇතිවූ වර්ෂාවකදී සේදී යාමෙන් බැම්ම බිඳීගොස් බෝක්කුවේ කොන්ක්‍රීට් තට්ටුව ජල මාර්ගය මතට කඩා වැටී තිබූ බව 2015 අප්‍රේල් මාසයේදි කරන ලද භෞතික පරික්ෂාවේදි අනාවරණය විය. ඒ අනුව මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කල මුළු මුදලම කිසිදු ප්‍රතිලාභයක් අත්නොවූ අසාර්ථක ව්‍යාපෘතියක් වෙනුවෙන් දරන ලද නිෂ්ඵල වියදමක් වි තිබුණි.

(ඇ) <u>ඉගිණිගහගොඩ වැව පාර බොරළු යොදා මාර්ග සංවර්ධනය කිරීම.</u>

- සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත "දොරින් දොර ගමින් ගම" ග්‍රාමීය ප්‍රවේශ මාර්ග සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කල මෙම කර්මාන්තය වෙනුවෙන් අනුමත කර තිබූ රු 980,935 ක ඇස්තමේන්තුව මත පදනම්ව මාස 03 ක කාල සීමාවක් තුල ඉටු කිරීම සඳහා කරදකැටිය ගොවි සංවිධානය සමඟ රු. 966,438 ක වටිනාකමින් යුත් ගිවිසුමකට 2014 සැප්තැම්බර් 12 දින එළඹ තිබුණි.

- ඇස්තමේන්තුවේ සඳහන් පරිදි ටොන් 10 ප්‍රමාණයේ මාර්ග තලනයක් මඟින් නිසි පරිදි තලා නොතිබීමත්, මාර්ගය මතින් මී ගවයින් ගමන් කරවීම නිසාත් මෙම මාර්ගය සංවර්ධනය කර ඉතාමත් කෙටි කාලයක් තුල ඇතිවූ වර්ෂා කාල සීමාවේදී ඇති වූ දැඩි ජල දහරාවන් මාර්ගය මතින් ගලායාම හේතුවෙන් මාර්ගයට යොදන ලද බොරළු පස් දැඩි ඛාදනයට ලක්වී තිබූ බව 2015 අප්‍රේල් මාසයේදි කරන ලද භෞතික පරික්ෂාවේදි අනාවරණය විය. ඒ අනුව මෙකී කර්මාන්තය

වෙනුවෙන් වැයකල රු. 849,439 ක මුළු මුදලම  කිසිදු ප්‍රතිලාභයක් අත් නොවූ නිෂ්කාර්යය වියදමක් වී තිබුණි.

(ඇ) <u>බොරළු යොදා මාර්ග සංවර්ධනය කිරීම</u>

- ඇස්තමේන්තු වැඩ වටිනාකම රු. 3,194,822 ක්වූ ප්‍රාදේශීය සභා අරමුදල් සහ ප්‍රධාන අමාත්‍යාංශ ප්‍රතිපාදන මුදල් යොදවා ඉටු කරන ලද මාර්ග 05 ක්  සම්බන්ධයෙන් නිසිලෙස මාර්ග තැලීම සිදු නොකිරීම, දෙපස කාණු විධිමත් ලෙස නොයෙදවීම, ප්‍රමිතියෙන් තොර පස් භාවිතය වැනි කරුණු හේතුවෙන් බොරළු යොදා සංවර්ධනය කරන ලද මාර්ග විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2015 අප්‍රේල් මස වනවිටද අබලන් තත්ත්වයට පත්ව ඇති බව නිරීක්ෂණය විය. විශේෂයෙන්ම යොදන ලද බොරළු වල ප්‍රමිතිය පිළිබඳ කිසිදු සහතික වීමක්, තත්ත්ව පරීක්ෂාවක් සිදු නොවන බැවින් බොරළු වෙනුවට අපද්‍රව්‍ය මිශ්‍රිත පස් භාවිතා කිරීම හේතුවෙන් වර්ෂා කාලයෙන් අනතුරුව මාර්ගයේ ස්ථාන ගණනාවක් මඩ වී ගමන් කිරීමට නොහැකි අන්දමින් අබලන් වී තිබුණි. මාර්ග සීමාවන් නිරවුල් නොවීම හා ප්‍රමාණවත් ඉඩක් නොමැතිකම හේතුවෙන් දෙපස කාණු නොයෙදීම නිසා වැසි ජලය මාර්ගයේ ගලා යාමෙන් යොදන ලද බොරළු සේදී ගොස් ඇති බවද තවදුරටත් නිරීක්ෂණය විය.

3.6 සන අපද්‍රව්‍ය කළමනාකරණය
----------------------------------

සභා සීමාවේ එකතුවන කසල බැහැර කිරීම ඇඹිලිපිටිය නගර සභාව සමඟ ඒකාබද්ධ වී කඳුරුගස්ආර ප්‍රාදේශයේ සිදු කරන අතර, ඇඹිලිපිටිය නගර සභාව සතු කසල ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය දැනට ක්‍රියාත්මක නොවන බැවින් එකතුවන කසල විවෘත භූමියට බැහැර කර දැමීම පමණක් සිදු  කරනු ලැබේ. එකී කසල ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කිරීම දිගින් දිගටම ප්‍රමාද වෙමින් පවතින අතර, ඒ නිසා බැහැර කරනු ලබන කසල,  වැසි කාල සීමාවේදී අසල පිහිටි චන්ද්‍රිකා වැවට සේදී යාමේ අවදානමක් පවතින බව  අනාවරණය විය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
----------------------------------------

අයවැය පාලනය
------------------

(අ) මනා සැලැස්මකින් යුතුව ප්‍රතිපාදන වෙන් නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 06 ක් සම්බන්ධයෙන් ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරුකිරීම් සහ වෙනත් වැය විෂයයන්ගෙන් ප්‍රතිපාදන ලබා ගැනීම් සිදුකර තිබූ අතර, තවදුරටත් රු. 1,121,468 ක ඉතිරිවීම් නිරීක්ෂණය විය.

(ආ) වැය විෂයයන් 03 ක් සම්බන්ධයෙන් රු. 2,411,900 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබූ අතර, රු. 2,799,540 ක පරිපූරක ඇස්තමේන්තු මඟින් නැවතත් එම වැය විෂයයන් සඳහා ප්‍රතිපාදන ලබාගෙන තිබුණි. මේ හේතුවෙන් අයවැය ලේඛණය සඵලදායි මූල්‍ය පාලන උපකරණයක් ලෙස පවත්වා ගෙන නොතිබූ බව නිරීක්ෂණ විය.

5. පද්ධති හා පාලන
-----------------------
පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඊ) සන අපද්‍රව්‍ය කළමනාකරණය